**පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 ව්‍යාචනය කළ මතය

පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2010 අගෝස්තු 10 දින අත්සන කරන ලද කළමනාකරණ භාර ඔප්පුවේ 10(ඇ) ඡේදය ප්‍රකාරව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 ව්‍යාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ ව්‍යාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, භාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා භාරය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

භාරයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, භාරයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ දී අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් වැය කර තිබූ රු.105,450,026 ක්වූ වටිනාකම ඉඩම් සහ සංවර්ධන වටිනාකමට එකතුකර ප්‍රමිත අංක 7 හි 50 ඡේදයට පටහැනිව මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි. | පිළිතුරු ලැබී නැත. | ප්‍රමිත ප්‍රකාරව එකම ස්වභාවයේ හා එකම භාවිතයෙන් යුත් වත්කම් පන්තීන් අනුව ගිණුම්ගත කළ යුතු බව. |
| (ආ) | ප්‍රමිත අංක 07 හි 57 ඡේදයට පටහැනිව මුළු පිරිවැය රු.38,598,438 ක් වූ පිරිපහදු යන්ත්‍රාගාරයේ යන්ත්‍ර හා ගොඩනැගිලි, වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමකින් තොරව සියයට 5 බැගින් ක්ෂය කර තිබුණි. | පිළිතුරු ලැබී නැත. | ප්‍රමිත ප්‍රකාරව යන්ත්‍ර හා ගොඩනැගිලි, වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ක්ෂය කළ යුතු බව. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.1,347,223 ක්වූ ලී බඩු හා උපකරණවල පිරිවැය ඉක්මවා ක්ෂය කිරීම නිසා සමුච්චිත ක්ෂය වෙන්කිරීම රු.1,348,065 ක් වී තිබුණි. තවද, ප්‍රමිත අංක 07 හි 65 ඡේදයට අනුව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් පාවිච්චි කරනු ලබන වත්කම් හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් මෙම වත්කම් සම්බන්ධයෙන් ඒ අනුව ක්‍රියාකර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | ප්‍රමිත ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් පාවිච්චි කරනු ලබන වත්කම් හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කළ යුතු බව. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 හා 2018 වර්ෂ සඳහා වටිනාකම රු. 828,000ක් වූ විගණන ගාස්තු බිල්පත් ඉදිරිපත් කර තිබිය දී අවශ්‍ය වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | විගණන ගාස්තු සඳහා වෙන්කිරීම් සිදු කළ යුතු බව. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- | --- |
| | | රු. | රු. | රු. | | |
| (අ) | ලෙජර් ගිණුම් 4 | 114,180,185 | 18,370,975 | 95,809,210 | පිළිතුරු ලැබී නැත. | මූල්‍ය ප්‍රකාශන හා වාර්තා අතර වටිනාකම් සසඳා වෙනසට හේතු පරීක්ෂා කර නිවැරදි අගය ගිණුම්ගත කළ යුතු බව. |
| (ආ) | ලෙජර් ගිණුම් ශේෂ 3 | 3,961,776 | 1,214,646,919 | 1,210,685,143 | පිළිතුරු ලැබී නැත. | මූල්‍ය ප්‍රකාශන හා වාර්තා අතර වටිනාකම් සසඳා වෙනසට හේතු පරීක්ෂා කර නිවැරදි අගය ගිණුම්ගත කළ යුතු බව. |
| (ඇ) | ලෙජර් ගිණුම් ශේෂ 18 | 346,406,831 | 0 | 346,406,831 | පිළිතුරු ලැබී නැත. | මූල්‍ය ප්‍රකාශන හා වාර්තා අතර වටිනාකම් සසඳා වෙනසට හේතු පරීක්ෂා කර නිවැරදි අගය ගිණුම්ගත කළ යුතු බව. |
| (ඈ) | ලෙජර් ගිණුම් ශේෂ 24 | 2,289,828,473 | 0 | 2,289,828,473 | පිළිතුරු ලැබී නැත. | මූල්‍ය ප්‍රකාශන හා වාර්තා අතර වටිනාකම් සසඳා වෙනසට හේතු පරීක්ෂා කර නිවැරදි අගය ගිණුම්ගත කළ යුතු බව. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ගොඩනැගිලි | 1,688,741,540 | ගොඩනැගිලි හඳුනාගැනීමට අදාල තොරතුරු | පිළිතුරු ලැබී නැත. | ස්ථාවර වත්කම් වෙන වෙනම හඳුනාගත හැකිවන පරිදි තොරතුරු පවත්වාගෙන යා යුතු බව. |
| (ආ) | ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී ආදායම | 22,484,737 | අලුත් කිරීම් නිවේදන | පිළිතුරු ලැබී නැත. | අලුත් කිරීම් නිවේදන ඉදිරිපත් කළ යුතු බව. |
| (ඇ) | සුළු මුදල් | 347,273 | බිල්පත් | පිළිතුරු ලැබී නැත. | සුළු මුදලින් කළ ගෙවීම්වලට අදාල බිල්පත් වවුචරය සමඟ ඉදිරිපත් කළ යුතු බව. |
| (ඈ) | තාවකාලිකව නවතන ලද ගෙවිය යුතු තැන්පතු | 5,550,000 | ශේෂ සනාථ | පිළිතුරු ලැබී නැත. | ශේෂ සනාථ කෙරෙන ලියකියවිලි ඉදිරිපත් කළ යුතු බව. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 5 කට වැඩි කාලයක සිට ධීවර සංස්ථාවෙන් ලැබිය යුතු රු.17,402,781 ක ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | දිගු කාලයක් තිස්සේ අයවිය යුතු මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.74,943,431 ක් වූ හිඟ බදුකුලී ආදායම් ශේෂය තුළ වර්ෂ 10 ක කාලයක් පුරා පවතින හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර විධිමත් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණු බැවින් 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ඒ ඒ වර්ෂය සඳහා හිඟ හිටි ආදායම් ප්‍රමාණය කොපමණ ද යන්න හඳුනාගත නොහැකි විය. තව ද 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා හිඟ බදු කුලී ආදායමෙන් අඩු කර ඇති එකතුව රු.3,605,683 ක ශේෂය අය වී ඇති කේවල ණයගැතියන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | දිගු කාලයක් තිස්සේ අයවිය යුතු මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | | රු. | | |
| (අ) | 2010 අගොස්තු 10 දිනැති භාර ඔප්පුව | | | | |
| | (i) | අංක 6(අ) 1 ඡේදය ප්‍රකාරව භාරයේ සියලුම ඉතිරිකිරීම් අතිරික්ත අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල, ආණ්ඩුවේ සුරැකුම්පත්වල හැර වෙනත් යම් ආකාරයකින් ආයෝජනය කිරීමට භාණ්ඩාගාරයේ පූර්ව ලිඛිත එකඟතාවයක් ලබාගත යුතු වුවත් එවැනි එකඟතාවයක් නොමැතිව කළමනාකරණ භාරය විසින් භාරකාර මණ්ඩලයේ තීරණයන් මත පමණක් රාජ්‍ය බැංකු දෙකක ආයෝජනය කර තිබුණි. | 208,108,367 | පිළිතුරු ලැබී නැත. | භාරය පිහිටුවීමේ ඇති කරගත් ගිවිසුමේ 6(අ)1 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| | (ii) | අංක 8(ඊ) ඡේදය ප්‍රකාරව වැටුප්, දීමනා හෝ සම්මත මුදලක් වශයෙන් යම් පරිශ්‍රමිකයක් ලබාගැනීමට භාරකරුවන්ට හිමිකමක් නොමැති බව සඳහන් වුවත් ඒ පිළිබඳව නොසලකා භාරකාර මණ්ඩලය සඳහා පළමුවැන්නා ලෙස නම් කළ, භාරකාර මණ්ඩලයේ | 315,000 | පිළිතුරු ලැබී නැත. | භාරය පිහිටුවීමේ ඇති කරගත් ගිවිසුමේ 8(ඊ) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | සභාපතිවරයා වන ධීවර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත 2020 වර්ෂයේ මාස 9 ක කාලයක් සඳහා මාසික දීමනා ලෙස ගෙවා තිබුණි. | | | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 261(1) ප්‍රකාරව මුදල් පොත හා වවුචර් පිළියෙල කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි 446(2) ප්‍රකාරව මුදල් පොත් සටහන් හා ශේෂයන් එසේ නිවැරදි බවට සනාථ කර ද නොතිබුණි. | | පිළිතුරු ලැබී නැත. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර පවත්වාගෙන ගොස් නොතිබුණි. | | පිළිතුරු ලැබී නැත. | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර පවත්වාගෙන යා යුතු බව. |
| (ඈ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 876(3) ඡේදය ප්‍රකාරව ව්‍යාවස්ථාපිත නොවන කිසියම් අරමුදලක් තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් නිතීගත කිරීමට හැකිවන පරිදි අදාළ හේතු දක්වමින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළයුතු වුවත් 2020 දෙසැම්බර් 31 දිනවන විටත් කළමනාකරණ භාරය පාර්ලිමේන්තු පනතක් මඟින් ව්‍යාවස්ථාපිත ආයතනයක් බවට පත්කරගෙන නොතිබුණි. | | පිළිතුරු ලැබී නැත. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව පාර්ලිමේන්තු පනතක් මඟින් ව්‍යාවස්ථාපිත ආයතනයක් බවට පත්කර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඉ) | 2013 අංක 17 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනතේ 10 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ බදුකුලී ආදායමින් එකතුකළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචිවීමට කටයුතු කර නොතිබුණි. | 84,829,967 | පිළිතුරු ලැබී නැත. | පනත ප්‍රකාරව එකතුකළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචිවීමට කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.40,748,885 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.1,603,164 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.39,145,721 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට භාණ්ඩාගාරයෙන් රු.50,000,000ක අරමුදල් මාරුකිරීමක් ආදායම් ලෙස ගිණුම්ගත කිරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ආදායම් ප්‍රවණතා | 2020 | 2019 | ප්‍රතිශතය | නිරීක්ෂණය |
|---|---|---|---|---|
| භාණ්ඩාගාරයෙන් අරමුදල් මාරුකිරීම | 50,000,000 | - | - | භාණ්ඩාගාරයෙන් අරමුදල් මාරුකිරීමක් ආදායම් ලෙස ගිණුම්ගත කිරීම නිසා ආදායම් වැඩිවීම. |
| බදු කුලී ආදායම් | 84,829,967 | 99,946,000 | 15% | ආදායම එකතු කිරීම නිසියාකාරව සිදුනොවීම. |
| වාහන ගාල් කිරීමේ ආදායම | 5,326,509 | 4,085,961 | 30% | වාහන පරිශ්‍රය තුළ ගාල් කරගෙන සිටින කාල ප්‍රමාණයට ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයක් තීරණය කර තිබීමත් ඒ අනුව පරිගණක මෘදුකාංගය වෙනස් කිරීමට කටයුතු කර තිබීම. |
| **වියදම් අඩුවීම්** | | | | |
| ජල ගාස්තු | 5,814,229 | 8,017,435 | 27% | කොවිඩ් වසංගතය නිසා වසා තැබීම හේතුවෙන් ජල පරිභෝජනය අඩුවීම. |
| නඩත්තු වියදම් | 3,187,040 | 3,762,635 | 15% | ඉකුත් වර්ෂයට වඩා නඩත්තු වියදම් අඩුවීම. |
| පිරිසිදුකිරීමේ හා නඩත්තු වියදම | 20,340,856 | 22,878,366 | 11% | කොවිඩ් වසංගතය නිසා මාස කිහිපයක් වසා තිබීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩලය අනුමත වී වසර 6 කට ආසන්න වුවත් භාරයේ කළමනාකරු, ගණකාධිකාරී හා අභ්‍යන්තර විගණක යන තනතුරු සඳහා 2020 දෙසැම්බර් 31 වන විටත් බඳවා ගැනීම් පරිපාටිය අනුමත කරවාගෙන බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | බඳවා ගැනීම් පරිපාටිය අනුමත කරවාගෙන බඳවා ගැනීම් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති I වැනි කාණ්ඩයේ IX වැනි පරිච්ඡේදයේ 120 ඡේදය ප්‍රකාරව රජයේ නිලධාරියෙක් තනතුරක වැඩ බැලීම සඳහා හෝ තනතුරක රාජකාරි ඉටුකිරීම සඳහා හෝ පත්කළ යුත්තේ එම තනතුර එම රජයේ නිලධාරියා දැනට දරන තනතුරට වඩා ඉහළ තත්ත්වයේ තනතුරක් හෝ සම තත්ත්වයේ තනතුරක් හෝ වන්නේ නම් පමණක් බවත් දක්වා තිබුණි. ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීම සඳහා ධීවර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ප්‍රධාන ගණකාධිකාරීවරයා පත්කර සමාලෝචිත වර්ෂය සඳහා භාරය විසින් රු.360,000 ක් ගෙවා තිබුණි. | පිළිතුරු ලැබී නැත. | දැනට දරන තනතුරට වඩා ඉහළ තත්ත්වයේ තනතුරක් හෝ සම තත්ත්වයේ තනතුරක් හෝ වන්නේ නම් පමණක් වැඩ බැලීම සඳහා හෝ තනතුරක රාජකාරි ඉටුකිරීම සඳහා හෝ පත්කළ යුතු බව. |
| (ඇ) | වෙළඳ සංකීර්ණය පිහිටුවා ඇති හෙක්ටයාර් 3.1776 ක විශාලත්වයෙන් යුත් ඉඩම, ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් ලබාගත් ඉඩමක් විය. උක්ත ඉඩමේ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා 2020 දෙසැම්බර් 31 දින දක්වා රු.1,742,461,943 ක් ද 2020 වර්ෂයේ දී මාර්ග පද්ධතිය ඉදිකිරීම සඳහා රු.105,450,026 ක් ද වශයෙන් එකතුව රු.1,847,911,969 ක් වැය කර තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයක් මඟින් අනුමැතිය ලැබී ඇති ඉඩම අත්පත් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව වෙළඳ සංකීර්ණය පිහිටි ඉඩම භාරයට පවරා ගත යුතු බව. |
| (ඈ) | 2016 මැයි 17 දින පැවති කළමනාකරණ භාර රැස්වීමේ දී රථවාහන අංගනයෙන් භාරයට ලැබිය යුතු ආදායම සංශෝධනය කළ යුතු බවත්, ශුද්ධ ආදායමින් සියයට 50 ක් භාරයට ලැබිය යුතු බවත් තීරණය කර තිබුණ ද භාරය විසින් එම ගිවිසුම සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | ගිවිසුම සංශෝධනය කර ශුද්ධ ආදායමින් සියයට 50 ක් භාරයට ලබා ගත යුතු බව. |
| (ඉ) | රථවාහන ආදායම එකතුකරන කොන්ත්‍රාත් සමාගම විසින් රථවාහන අංගනය සඳහා සේවකයන් 18 ත් 21 ත් අතර සංඛ්‍යාවක් සේවයේ යොදවා තිබුණු අතර සෑම මාසයකම රු.100,000 ක් හා රු.50,000 ක් බැගින් වැටුප් ගෙවා තිබුණු සේවකයින් ද සිටි බැවින් අංගන ආදායම ගණනය කිරීමේදී විශාල මුදලක් වැටුප් වශයෙන් ආදායමෙන් අඩුකර තිබුණි. එසේ වුවද අදාල සේවකයන් පරිශ්‍රයේ රාජකාරීවල යොදවා තිබූ බව අධීක්ෂණයක් සිදු කර නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දීමෙන් පසු අදාළ සමාගමේ මෙහෙයුම් කටයුතු අධීක්ෂණයක් සිදු කළ බව දන්වා ඇත. | මෙහෙයුම් කටයුතු අධීක්ෂණයක් සිදු කළ බව සනාථ කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2019 ඔක්තෝබර් 17 දිනැති කළමනාකරණ භාර රැස්වීමේ දී ශීතාගාර 3 ක් හා පතුරු අයිස් යන්ත්‍රාගාරය අලුත්වැඩියා කර පවත්වාගෙන යාම හා නව කැට අයිස් යන්ත්‍රාගාරයක් ඉදිකර පවත්වාගෙන යාමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ඉදිරි වර්ෂ 5 ක් සඳහා ගිවිසුමක් පිළියෙල කළ යුතු බවට තීරණය කර තිබුණ ද එවැනි ගිවිසුමක් පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | ගිවිසුමක් පිළියෙල කළ යුතු බව. |
| (උ) | අපජලය පිරිසිදු කර මුදාහරින පවිත්‍රාගාරයක් (Treatment Plant) 2010 වර්ෂයේ රු.38,598,438 ක් වැයකර ඉදිකර ඇතත් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර අදාළ ධාරිතාවය අනුව නිසි සැලසුමකින් යුක්තව ඉදිකිරීමට පියවර නොගැනීම නිසා අපජලය පිරිසිදු කර මුදාහරින ක්‍රියාවලිය නිසි පරිදි ක්‍රියාත්මක වී නොතිබීමෙන් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමේ අයදුම් පත්‍රය 2014 මාර්තු 18 දින ඉදිරිපත් කර තිබුණ ද පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමට සමාලෝචිත වර්ෂය දක්වා කටයුතු කර නොතිබුණි. | නව පවිත්‍රාගාරයක් ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර 2021 ජුනි 15 දින නිම කිරීමට නියමිත බවත් ඒ අනුව අදාළ ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | නව පවිත්‍රාගාරය ඉදිකිරීම් කටයුතු කඩිනම් කර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමට කටයුතු කළ යුතු බව. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙළඳසැල් 154 කින් යුක්තව ඉදිකර තිබුණු තොග වෙළඳ සංකීර්ණයට අමතරව වෙළඳසැල් 128 කින් යුත් සිල්ලර වෙළඳ සංකීර්ණයක් ද ඉදිකර තිබුණි. එම සිල්ලර වෙලඳසැල්වලින් 64ක් 2012 වර්ෂයේ දී රු.9,625,540 ක් වැයකර තොග වෙළඳසැල් බවට පරිවර්තනය කර තිබුණි. විගණිත දිනය වූ 2020 දෙසැම්බර් 31 දින වන විටත් එම සංකීර්ණයේ සිල්ලර වෙළඳසැල් හා පරිවර්තනය කළ තොග වෙළඳසැල් සියල්ලම අලෙවි කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබූ අතර ව්‍යාපාරික සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | වෙළඳසැල් සියල්ලම අලෙවි කටයුතු සඳහා යොදා ගෙන ව්‍යාපාරික සැලැස්මක් ද පිළියෙල කළ යුතු බව. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බදු ගැණුම්කරුවන් විසින් බදු ගිවිසුම උල්ලංඝණය කරමින් භාරයට වෙළඳසැල් භාර නොදී වෙනත් පාර්ශවයන්ට ලබා දී තිබීම සම්බන්ධයෙන් භාරය විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(අ), (ආ) හා (ඇ) සහ මාර්ගෝපදේශයන්ගෙන් බැහැරවී තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි කටයුතු කළ යුතු බව. |

**4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 877(2)(ඇ)ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන ද සමඟ කාර්යසාධන වාර්තාවක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාට ද පිටපතක් සහිතව විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 04 ක් ප්‍රමාදව 2021 ජූලි 19 දින විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබුණද කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ද සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව. |